# 16 සාක්ෂියේ දිරියෙන් මෙහෙවර

පාවුල්තුමා රෝමයට සිරකරුවකු ලෙස ගිය ගමන අධ්‍යයනය කිරීම තුළින් කිතුනුවකු සාක්ෂි දැරිය යුතු අයුරු මින් පැහැදිලි කෙරේ. සැම විට ම ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් ඉවසීමෙන් සත්‍යවාදීව හා එඩිතරව ක්‍රියා කිරීමට යොමු වීමේ වැදගත්කම ද ඉදිරිපත් කිරීම මෙම පාඩමින් අපේක්ෂිත ය.

**ක්‍රියා 25:10-11, 26:32,27,28 පරිච්ඡේද**

තුන්වන ධර්මදූත ගමන අවසානයේ දී අගබස් නම් දිවැසිවරයා පැවසූ ලෙසට ම ජෙරුසලම් දේව මාලිගාවේ දී පාවුල්තුමා අත්අඩංගුවට පත්විය. ජුදෙව් මන්ත්‍රණ සභාව ඉදිරියේත් ෆීලික්ස් ආණ්ඩුකාරයා ඉදිරියේත් ඔහු විනිශ්චයට ලක්විණි. පාවුල් ක්‍රිස්තුන් වහන්සේගේ නාමය උදෙසා කොපමණ දුක් විඳින්ට ඕනෑ දැයි ඔහුගේ හැරීම සිදුවන අවස්ථාවේ දුටු දර්ශනය ලෙසට ජෙරුසලමේදී ඔහු සාක්ෂි දැරීය.

## රෝම ගමනේ දී සාක්ෂි දැරීම

කියවා බලමු.

**ක්‍රියා 25: 10-11, 26: 32 - 27: 1**

නායක පූජකයන්ගේ හා ජුදෙව්වරුන්ගේ අරමුණ වූයේ පාවුල්තුමාට ජෙරුසලමේ දී ම දඬුවම් කොට මරා දැමීමට යි.

තමාට එරෙහි ව ඇති චෝදනා සම්බන්ධයෙන් තමා නිර්දෝෂ බව පාවුල්තුමා දැන සිටියේ ය. රෝම පුරවැසියෙකු වශයෙන් තමාට හිමි වරප්‍රසාදය යටතේ, රෝම අධිරාජ්‍යයාගේ විනිශ්චය ලබාගැනීම සඳහා ඔහු අයැද සිටියේ, කෙසේ හෝ රෝමයට යාමේ අභිප්‍රාය ඉටුකර ගැනීම සඳහා ය. ෆෙස්තුස් හා අග්‍රිපා රජු විසින් පාවුල්තුමාට එම අවස්ථාව ලබාදීමෙන් පාවුල්තුමාගේ රෝමයට යාමේ අභිප්‍රාය මල් ඵල ගැන්විණි.

පාවුල්තුමා සිරකරුවකු ලෙස රෝමය බලා ගමන් කරයි.
ඔහු සමග ලූක් හා අරිස්තාර්කස් ද ගමනට එක්වේ.

## ගමන ආරම්භයේ දී ම සාක්ෂි දැරීම (ක්‍රියා 27: 1-13)

සිරකරුවකු ලෙස පාවුල්තුමා ගෙනයනු ලැබුවේ ඉතාලිය බලා යන නැවක ය. එහිදී තවත් සිරකරුවන් කිහිප දෙනකු ද ගෙන යන ලදී.

අගෝස්තීනු නම් බල ඇණියේ ජූලියස් නම් ශතාධිපතියාට මෙම සිරකරුවන්ගේ වගකීම පැවරිණ.

**පාවුල්තුමා සිය ජීවිතයෙන් සාක්ෂි දරයි**

- ශතාධිපතියාගේ ගෞරවය ඔහුට හිමි වේ
- ඔහුගේ කරුණාවට පාත්‍ර වේ.
- යම් තාක් දුරකට නිදහස භුක්ති විඳීමට ඔහුට අවස්ථාව ලැබේ.

**නිවැරදි උපදෙස් දීම මගින් සාක්ෂි දැරීම (ක්‍රියා 27: 4-12)**

සයිප්‍රසයේ වෙරළාසන්නය → සිසිලිය හා පම්පිලියාවේ වෙරළාසන්න මුහුද → ලිසියාවේ මුරා නුවර

↓

ශතාධිපතියා විසින් ඉතාලියට යන ඇලෙක්සැන්ඩ්‍රියාවේ නැවකට පාවුල් ඇතුළු පිරිස නැංවීම.

→ ක්‍රීතයේ වෙරළ → සල්මොන් තුඩුව → සුන්දර වරාය

↓

ජීවිතවලට බඩු බාහිරාදියවලට ඇති අනතුරුදායක බව පිළිබඳව පාවුල්තුමා උපදෙස් දුන් නමුත් ශතාධිපතියා වඩාත් සැලකුයේ නැව්පතියාගේ හා නැව් අයිතිකරුගේ උපදෙස් ය → ක්‍රීතයේ වරායක් වූ පෙනීකිය → මෙහිදී ශීත කාලය ගතකිරීමට බොහෝ අය කැමති වූහ.

මාලිමාවක් නොතිබූ පැරණි කාලයේ නැව් ගමන් සඳහා මග දැක්වූයේ තාරකා යි. බිහිසුණු කාලගුණ තත්ත්වයන් පැවති කාලවල නැව් ගමනාගමනය වඩාත් අන්තරාදායක විය. එමෙන් ම සැප්තැම්බර් මස නැව් ගමනාගමනය සැක සහිත වූ අතර, නොවැම්බර් මස වන විට එය වඩාත් බිහිසුණු හා ඉතා අපහසු කාර්යයක් විය. පාවුල්තුමා හා පිරිස රෝමය බලා යාමේ මෙම සිදුවීම ඔක්තෝබර් මස සිදු වූ බව පිළිගැනෙන අතර මේ සියල්ල ගැන අත්දැකීමෙන් සිටි පාවුල්තුමාගේ සත්‍යවාදී අදහස් හා උපදෙස් මෙහි දී සැලකිල්ලට භාජනය නොවීම අභාග්‍ය සම්පන්න වූ බව මෙම ගමනේ ඉදිරි සිදුවීම් මගින් පැහැදිලි වේ.

**කුණාටුවේ දී හා නැව බිඳීයාමේ දී සාක්ෂි දැරීම (ක්‍රියා 27:13-44)**

ක්‍රීතයට යාමෙන් අර්බුදයකට මුහුණ දීම
ඔවුන් මුහුණ දුන් අර්බුදය කුමක්දැයි ඔබ දන්නවා ද ?

↓

එව්රකුලොන් නම් කුණාටුව යි

↓

නාවිකයන්ට වඩාත් හුරු පුරුදු බිහිසුණු විපත් ගෙන දුන්, මෙම චණ්ඩ මාරුතය ඊසාන දෙසින් හැමී ය. බිහිසුණු බව හේතුවෙන් එම නමින් හැඳින්විණි

↓

**චණ්ඩ මාරුතය හේතුවෙන්**

- ජීවිත ආරක්ෂාව පිළිබඳ ගැටලු මතු විය → බිය, සැක
- තමාට හිමි බඩු බාහිරාදිය අහිමි විය → අධෛර්‍යය වීම
- අඳුරු පරිසරයක දිවි රැකගැනීමට සිදු විය → කළකිරීම, ආත්ම විශ්වාසය බිඳ වැටීම

**ජීවිත අර්බුද නිසා ඇතිවන කුණාටු හේතුවෙන්** → බිය, සැක / අධෛර්‍යය වීම / කළකිරීම, ආත්ම විශ්වාසය බිඳ වැටීම

මේ සියලු අර්බුද මැද පාවුල්තුමා ඇදහිල්ලේ ස්ථිරව ම සිටිමින් සාක්ෂි දරයි.

කියවා බලමු.

## ක්‍රියා 27:21-26

මා වැඳුම් පිදුම් කරන මාගේ ම දෙවියන් වහන්සේගේ දූතයෙක් ඊයේ රාත්‍රියේ මා ළඟ සිට"පාවුල් බිය නොවන්න ඔබ අධිරාජ්‍යයා ඉදිරියේ සිටින්නට ම ඕනෑ ය. මෙන්න ඔබ සමඟ නැවෙන් යන සියල්ලන්ගේ ද ආරක්ෂාව දෙවියන් වහන්සේ ඔබට දුන් සේක"යි කී ය.(ක්‍රියා 27: 23-24)

පාවුල්තුමාගේ මෙම සාක්ෂි දැරීමෙන්, ශතාධිපතියා හා නැවියෝ පාවුල්ට විශ්වාසයෙන් සවන් දුන්හ. නොපසුබට ව අවශ්‍ය පියවර ගත්හ. සියල්ලෝ ම දිරිමත් වූහ. කෑම කා ශක්තිය ලැබූහ.

**සාක්ෂි දැරීමෙන්, ජීවිත කුණාටු හා අභියෝග ජයගැනීමට සවිය හා දිරිය ලැබේ.**

හිරකරුවකු ව සිටියද අභියෝග මධ්‍යයේ සාක්ෂි දැරීමෙන් අන් අය දිරිමත් කළ පාවුල්ගේ දිවි සුරැකීමට ශතාධිපතියා ඉදිරිපත් විය. (ක්‍රියා 27: 42-44)

### මෝල්ටාවේ දී සාක්ෂි දැරීම (ක්‍රියා 28: 1-10)

මෝල්ටාව, සිලිසියාවට සැතපුම් 60 ක් පමණ දකුණින් පිහිටි නගරයකි. එහි වෙළඳාම සඳහා වැදගත් වූ වරායන් කීපයක් පිහිටා තිබිණි.

මෝල්ටාවේ වැසියන්

- සීතල නිසා ගිනි මැලයක් ගසා පාවුල් ඇතුළු පිරිස පිළිගන්නා ලදී
- තුන් දවසක් ඔවුන් ආගන්තුක සත්කාර දක්වන ලදී.
- පාවුල් ඇතුළු පිරිස පිටත්ව යන කළ ඔවුන්ට වුවමනා දේ නැවට පැටවී ය.

සර්පයකු පාවුල්ගේ අතෙහි එල්ලුන ද, අනතුරක් සිදු නොවී ම තුළින් ඇති වූ සාක්ෂි දැරීම අපට දැක ගත හැකි ය. (ක්‍රියා 28: 3-6)

මුලින් ඔහු මිනිමරුවෙක් යනුවෙන් සෙනඟ තුළ පැවති අදහස ඔහු දෙවි කෙනෙකි යි යන්න දක්වා වෙනස් විය. ලුස්ත්‍රාවේ සිදුවීමට පසු දේවත්වයෙන් සැලකූ දෙවන අවස්ථාව ලෙස මෙය හැඳින්විය හැකි ය.

දිවයිනේ ප්‍රධානියා වූ පබ්ලියස්ගේ පියා උණෙන් හා අතීසාරයෙන් පෙළුණ විට ඔහු ඇතුළු වෙනත් රෝගීන් සුවකිරීමෙන් ද සාක්ෂි දරන්නට හැකි විය. (ක්‍රියා 28: 7-10)

යාච්ඤාවෙන්, විශ්වාසයෙන්, ප්‍රාතිහාර්ය සිදු කිරීමෙන් සාක්ෂි දැරීමට ඉදිරිපත් වූ පාවුල්තුමාගේ සඵලවත් මෙහෙවර මෙම ගමනේ දී අපට පැහැදිලි වේ.

## රෝමයේ දී සාක්ෂි දැරීම (ක්‍රියා 28: 11-30)

පාවුල්තුමා රෝම අධිරාජයාගේ විනිශ්චය අපේක්ෂාවෙන් දේව ප්‍රඥාව හා මග පෙන්වීම ඇතිව අන්තරායදායක නැව් ගමනක් නිමා කරමින් රෝමයට පැමිණියේය. මෙහි දී ජුදෙව් ප්‍රධානීන් අතරට ගොස් ඔහුගේ ජීවිත සාක්ෂිය දැරීය. පාවුල් ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීමේ තම ඒකායන අභිප්‍රාය මුදුන් පමුණුවා ගත් අයුරු මෙහි දී පැහැදිලි වේ.

ජීවිත ගමනේ දී කිතුනුවන්ට කෙතරම් බාධක, අර්බුද, ගැටලුවලට මුහුණ පෑමට සිදු වුවද, ඒ සියල්ල මධ්‍යයේ විශ්වාසවන්තව සිටිමින්, ඒවා ජයගැනීමට ශුද්ධාත්ම මඟ පෙන්වීම හා දිරිය නො අඩුව ලැබෙන අයුරු පාවුල්තුමාගේ රෝමයට යාමේ ගමන තුළින් අපට පසක් කර දෙයි. එසේම අර්බුද හා අභියෝග මැද එඩිතර ව සත්‍යයට සාක්ෂි දැරීමේ අවශ්‍යතාව කිතුනුවන් වටහා ගැනීම වැදගත් ය.

සිරගතවීම්, පහරකෑම්වලට ලක්වීම්, අසාධාරණ විනිශ්චයන්ට මුහුණදීම් ආදී විවිධ අර්බුද හා අභියෝගවලට මුහුණ පෑමට ඔහුට සිදුවිය. ධර්මදූත ගමන් යෑමෙන්, ලිපි ලිවීමෙන් හා විශේෂයෙන් රෝමයට යෑමේ ගමනින් ද අවසානයේ ක්‍රි. ව. 64 දී නීරෝ අධිරාජ්‍යයාගේ සමයේ වේද සාක්ෂික මරණයකට මුහුණ දුන් බව කියවේ. මෙසේ ක්‍රිස්තුස්වහන්සේගේ විශ්වාසවන්ත සේවකයෙකු ලෙස සාක්ෂි දැරීමේ දිවියක් ගතකිරීමට පාවුල්ට හැකි විය. එතුමා මුළු මහත් කිතුනු සභාවට ම ආදර්ශයකි, ආලෝකයකි.

**ක්‍රියාකාරකම්**

1. රෝමයට යන ගමන පාවුල්තුමා සාක්ෂි දැරීම සඳහා යොදාගත් අයුරු සනාථ කිරීම සඳහා නිදසුන් කිහිපයක් ලියා දක්වන්න.

2. ඔබේ ජීවිතයේ කුණාටු ඇතිවන විට ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරිය හැකි ආකාර 3 ක් දක්වන්න.